# ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා හා සම්බන්ධ මාර්ගෝපදේශ

1. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව ආරම්භ කිරීමට පෙර එයට අදාළ මාර්ගෝපදේශ අනුව, අදාළ ආකෘති පත්‍ර (ඇමුණුම 1) භාවිත කොට පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ.

2. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා වන අයදුම්පත් අදාළ අධ්‍යයන වර්ෂය ආරම්භවීමෙන් පසු එළඹෙන මුල් සති දෙකක (02) කාලය තුළ පර්යේෂණ හා ප්‍රකාශන අංශයට ලැබෙන සේ අදාළ පීඨ කාර්යාලය වෙත භාරදිය යුතු වේ. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා අයදුම්පත් ඇගයීම සඳහා ම කැඳවනු ලබන පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ විශේෂ රැස්වීමකදී මෙම අයදුම්පත් සළකා බලනු ලැබේ. අදාළ අයදුම්පත් මෙම මාර්ගෝපදේශ අනුව ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලබන අතර කමිටු අනුමැතිය ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි චාරිකාව සඳහා දින සංවිධානය කළ යුතු වේ.

3. නියමිත කාලය තුළ ඉදිරිපත් නොකරන අයදුම්පත් යළි සළකා බලනු නොලැබේ.

4. අධ්‍යයන නිවාඩු කාලය තුළ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සංවිධානය නොකළ යුතුය.

5. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව යාමට ඇති අවශ්‍යතාව, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවේ අරමුණු ඇගයීමට බලාපොරොත්තු වන ආකාරය, අපේක්ෂා කරන ආධාර මුදල හා එය වැය කිරීමට අපේක්ෂා කරන ආකාරය යන තොරතුරු අයදුම්පතෙහි සඳහන් කිරීමේදී පැහැදිලිවත්, විස්තරවත් ඇතුළත් කළ යුතුය.

6. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා සහභාගී වන ආචාර්යවරුන් අදාළ විෂය ඒකකය ඉගැන්වීමට සම්බන්ධ ආචාර්යවරුන් පමණක් විය යුතු අතර සහභාගී වන ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව එම විෂය ඒකකය උගන්වන ආචාර්යවරයාගේ / අංශ ප්‍රධානගේ නිර්දේශය හා පීඨාධිපතිගේ අනුමැතිය මත තීරණය විය යුතු වේ. ශිෂ්‍යයන් සහභාගී වන අවස්ථාවලදී ආචාර්යවරියක / ආචාර්යවරියන්ද අනිවාර්යයෙන් සහභාගී විය යුතු වේ.

7. චාරිකාව සඳහා අයදුම් කිරීමේදී පැහැදිලි හා ප්‍රමාණවත් විස්තර සහිතව මුදල් වියදම් කිරීමට අපේක්ෂා කරන ආකාරය ද සඳහන් මුදල් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය. එම වියදම් විශ්වවිද්‍යාලයීය මුදල් රෙගුලාසිවලට අනුකූල වන සේ කළ යුතු වේ.

8. අනුමත ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා අත්තිකාරම් මුදල් ලබාගැනීමේ වවුචර්පත් නිසි පරිදි සම්පූර්ණ කර අදාළ අනුමැතීන් සහිතව ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව යෙදෙන දිනට දින 07කට පෙර ගෙවීම් අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

9. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා බාහිර ආයතනවලින් වාහන ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, මිල ගණන් කැඳවීමේ ක්‍රමවේදය අනුව ප්‍රවාහන අංශය විසින් එම කාර්යය කළ යුතු බැවින්, ඒ බව ප්‍රවාහන අංශය වෙත ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවෙහි යෙදෙන දිනට දින 14කට පෙර දිය යුතු ය.

10. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී එම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව අයත්වන විෂය ඒකකය හා එම විෂයය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවේ අදාළ භාවය පැහැදිලි ලෙස දැක්විය යුතු ය.

11. වැය කරනු ලබන මුදල (සාධාරණීකරණය කළ හැකි වන පරිදි ) පහත සඳහන් ආකාරයේ කටයුතු සඳහා පමණක් වැය කළ හැකි ය.

   i) ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා ( ප්‍රවාහන අංශය විසින් යෝජිත ආකෘති පත්‍ර භාවිත කොට)

   ii) ප්‍රවේශ පත්‍ර ගාස්තු, රථ ගාල් කිරීම සඳහා වන ගාස්තු (චාරිකාවට අදාළ ස්ථාන සඳහා පමණක්)
   විශේෂ අවස්ථාවලදී අමතර ප්‍රවාහන කටයුතු සඳහා ( ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා මුහුද හෝ මිරිදිය ජලාශවල බෝට්ටු මඟින් යෑම ආදී වශයෙන්)

iii)චාරිකාවේ අරමුණුවලට අදාළ ඡායාරූප, පටිගත කිරීම් සඳහා වන වියදම්, චාරිකාවට අදාළ වන අවස්ථාවලදී මාර්ගෝපදේශකවරුන් හා ක්ෂේත්‍ර සහායකවරුන් සඳහා ගාස්තු.

iv) නවාතැන් පහසුකම් සඳහා වන වියදම් ආදී වශයෙනි.

v) චාරිකාව වෙනුවෙන් අනුමත මුදල් ආහාර පාන සඳහා භාවිතා කළ නොහැකි වේ.

vi)චාරිකාව සඳහා යොදාගනු ලබන විශ්වවිද්‍යාලයේ රියදුරු මහතුන්ට හා රිය සහායකයින්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අතිකාල සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛනයට අනුව ගෙවීම් කටයුතු කළ යුතු වන අතර එම මුදල චාරිකාව සඳහා අනුමත මුදලින් ගෙවිය යුතු වේ.

12. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව නිමවී දින 14 ක් තුළ ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම කළ යුතු අතර ඒ සමග සතියක කාලයක් තුළ විශ්වවිද්‍යාලය මගින් අනුමත ආකෘතිය අනුව සකස් කළ වාර්තාවක් සහ අදාළ චාරිකාව පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පර්යේෂණ හා ප්‍රකාශන අංශය වෙත යොමු කළ යුතු වේ. අත්තිකාරම් පියවීම් වවුචරය පර්යේෂණ හා ප්‍රකාශන අංශය හරහා ගෙවීම් අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

13. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවට අදාළව ක්ෂේත්‍රය තුළ විශේෂ දේශන / කෙටි පුහුණු වැඩමුළු පැවැත්වීම අවශ්‍ය යැයි විෂය උගන්වනු ලබන ආචාර්යවරයා/වරිය, අංශ ප්‍රධාන හා පීඨාධිපති තීරණය කරනු ලබන අවස්ථාවකදී එබඳු දේශන / පුහුණු වැඩමුළු සඳහා සම්පත්දායකයින්ට කරනු ලබන ගෙවීම් එම චාරිකාව සඳහා අනුමත මුදලින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය රෙගුලාසි අනුව කළ හැකි වේ.

14. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවට අදාළව පවත්වනු ලබන විශේෂ දේශනයක් හෝ වැඩමුළුවක් සඳහා ආචාර්යවරයෙකුට පැයකට ගෙවන මුදල වැය වාර්තාවෙහි පැහැදිලි ලෙස සඳහන් විය යුතුය.

15. අධ්‍යයන චාරිකාවට අදාළව දරනලද සියලුම වියදම් විශ්වවිද්‍යාල මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය.

16. පසුගිය වසරේ අනුමත කරනලද ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා අදාළ වාර්තාව ඉදිරිපත් කර තිබිය යුතු ය.

17. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී අනුමත කරගත් විෂය ඒකක, ගමන් ගන්නා දිනයන් හා ගමන් ගන්නා ස්ථාන සහ සිසුන් ගණන වෙනස් වන්නේ නම්, පෙර අනුමත කර තිබූ ඇස්තමේන්තුව නො ඉක්මවා 2023/09 කමිටුවේදී නිරදේශ වූ පහත නිර්ණායකයන් පරිදි කටයුතු කළ යුතුය.

18. පෙර මුදල් කමිටු අනුමත වූ ඇස්තමේන්තු වෙනස්වීමකදි පමණක් නැවත පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

19. පෙර මුදල් කමිටු අනුමත වූ ඇස්තමේන්තු වෙනස්වීමකදී පමණක් නැවත පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

❖ ඒ අනුව, පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව විසින් නිර්දේශ කරන ලද එම උදෘතය මතු දැක්වේ

**2023/09/21 – Policy Decisions on Amendment to Field Visits**

The Research and Publication Committee proposed the following amendment for authority to approve changes to Filed Visits.

| Type of amendment | Authority to amendment |
|---|---|
| Course code | Dean |
| Estimate | Research and Publication Committee |
| Date | Dean<br>Without exceeding the budget estimate |
| Venue/ Site | |
| No. of students | |